**මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාව**
**මුලතිව් දිස්ත්‍රික්කය**
**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුලි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 10 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**
---------------------------

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතුව තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | සභාව විසින් වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදීත්, ඒවා ඉදිරිපත් කිරීමේදීත් අනුගමනය කළ යුතු පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති නියමිත අයුරින් අනුමත කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට සභාවේ ලේකම්වරයා සහ පලාත් පාලන කොමසාරිස්වරයා විසින් කටයුතු කළ යුතුය. | ඉදිරි කාලයේදී ක්‍රියාත්මක කරනු ලැබේ. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**
---------------------

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.7,290,725 ක් වටිනා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සභාවට ලබා දී තිබූ පිකප්, ට්‍රැක්ටරය සහ උතුරු පලාත් සභා ප්‍රධාන ලේකම්වරයා විසින් | සභාවට අයත් වාහන පමණක් තක්සේරු කර වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. | ඩබල් කැබ් පිකප් වාහනයක් බැංකුවේ ලීසිං පදනම මත තිබෙන නිසා ලීසිං අවසන් වූ පසුව පවරා ගනු ලබන නිසා එහි වටිනාකම අවසන් ගිණුම්වල ඇතුළත් කර ඇත. පළාත් සභා |

| | | |
|---|---|---|
| ලබාදුන් රු.1,020,000 ක් වටිනා ට්‍රැක්ටරය ආදිය සභාවට අයත් නොවූ නමුත් ඒවායේ වටිනාකම ද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. මේ නිසා ස්ථාවර වත්කම්වල වටිනාකම එකතුව රු.8,310,725 කින් වැඩියෙන් දැක්වුණි. | | සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ උතුරු පළාත් ප්‍රධාන ලේකම්වරයා විසින් ලබා දී තිබූ ට්‍රැක්ටර් 02 ක් සම්බන්ධයෙන් වාහන පැවරීමේ ඉල්ලුම් පත්‍ර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට යවා ඇත. |

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛනයේ ඉඩම් කොටස් 23 ක් විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්තව එකතුව රු.47,750 ක වටිනාකමකින් ඉඩම් කොටස් 15 ක් සමාලෝචිත වර්ෂ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවත්, මෙම ඉඩම් සඳහා හිමිකම් ඔප්පු, ඉඩම් මිනින්දෝරු ප්ලෑන සහ තක්සේරු සහතික යනාදිය ඉදිරිපත් කර නොතිබීමෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | සභාවට අයත් දේපල සම්බන්ධිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල, මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ විධිමත් අදහස් එකඟතාවයන් සහ අනුමැතිය අනුව එමඟින් ඉඩම් හිමිකම් ඔප්පු ලබාගෙන මිනින්දෝරු ප්ලෑන මඟින් සාක්ෂි සමඟ අනුමත මිල තක්සේරුකරු හෝ රජයේ තක්සේරුකරුගෙන් ඒවායේ වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ඒමට සභාවේ ලේකම්වරයා සහ පළාත් පාලන කොමසාරිස්වරයා විසින් කාල ප්‍රමාදයකින් තොරව ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉඩම් 15 කින් ඉඩම් 09 ක් සඳහා පසුගිය කාලයේ පැවති යුද වාතාවරණය හේතුවෙන් ලිපිලේඛන විනාශව පැවති ඉඩම්වල හිමිකම් ඔප්පු නොමැති නිසා මිල තක්සේරු කළ නොහැකි විය. මේවා සඳහා හිමිකම් ඔප්පු ඉල්ලීම් කර මාන්තායි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම්වරයාට 2018.10.08 දිනැති ලිපිය මඟින් හිමිකම් ඔප්පු ඉල්ලීම් කර ඇත. ඒවා මේ දක්වා ලැබී නොතිබුණි. ලැබූ වහාම තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු පිරිවැය තක්සේරු කර ගිණුම් වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) සභාවට අයත් පොන්නගර් වෙළඳපොල ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු කර සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණු අතර එහි ඓතිහාසික පිරිවැය, ඉදිකිරීම් කාර්යයන් පිළිබඳ ලිපිගොනු ද විගණනයට ලැබී නොතිබුණි. | සම්බන්ධිත කරුණට අදාළ ලිපිගොනුව විගණනයට ඉදිරිපත් කිරිමට ලේකම්වරයා විසින් ක්‍රියාමාර්ග ගත යුතුය. තවද, වෙළඳපොලේ දේපල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ආ යුතුය. | පොන්නගර් වෙළඳපොල ගොඩනැගිල්ල පිළිබඳ වටිනාකම දෝෂයකින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට ගෙනැවිත් නොතිබුණි. ඉදිරි වර්ෂයේදී ගිණුම් වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) පරිච්ඡේදය III රීති 33 | වරිපනම් සම්බන්ධයෙන් සමීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වරිපනම් බදු තක්සේරු කිරීම් සිදුකර වරිපනම් බදු ගණනය කර වාර්ෂිකව වරිපනම් බදු සෑම කාර්තුවකම සභා බල ප්‍රදේශයට අයත් දේපලවලින් නියමිත පරිදි අයකිරීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුය. | වරිපනම් බදු සම්බන්ධයෙන් සභා බල ප්‍රදේශයේ පවතින ඉඩම් හිමිකම් ඔප්පු සහිත ඉඩම් නොවන අතර ප්‍රදේශය සංවර්ධනය නොවූ දුෂ්කර ප්‍රදේශයක්ව පවතින නිසා වුවත් වරිපනම් බදු පිළිබඳ තක්සේරු කිරීමේ උත්සාහයන් අඛණ්ඩව සිදු කරමින් පවතී. |
| (ii) පරිච්ඡේදය II රීති 66 | රු.9,780,400 ක් වටිනා වර්ග 05 කට අයත් හිඟ ආදායම් අයකිරීම සඳහා කාර්යක්ෂම ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වාර්ෂිකව හිඟ ආදායම් නියමිත අයුරින් අයකරගැනීම සඳහා සභාවේ ලේකම්වරයා විසින් කාර්යක්ෂම ක්‍රියාමාර්ග ගත යුතුය. | සභාවට ආදායම් නිලධාරියෙකු නොවන නමුත් හිඟ මුදල් අයකිරීමේ කටයුතු ක්‍රියාත්මකව පවතී. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත් වූ ඇප මුදල් තැන්පතු 05 ක් සහ ආපසු ගෙවිය යුතු ලංසු ඇපකර තැන්පතු සම්බන්ධයෙන් ඵලදායී ක්‍රියාමාර්ග නොගෙන මාස 12 සිට මාස 16 ක් දක්වා රු.235,466 ක් වටිනා මුදල් තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. | කාලය ඉක්ම වූ තත්ත්වයේ පැවති මෙවැනි තැන්පතු විධිමත්ව පරිශීලනය කර ආපසු ගෙවීමට හෝ නිරවුල් කිරීමට හෝ නැතහොත් විධිමත් අනුමැතීන් සහිතව රජයේ ආදායමට මාරු කිරීමට කටයුතු කළ යුතුය. | තාක්ෂණික නිලධාරියාගේ වාර්තාවට අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 3.4.3 මාර්ගෝපදේශය | ලිපිද්‍රව්‍ය, විදුලි උපකරණ, මෝටර් රථ අලුත්වැඩියා, වාර සහරා, ප්‍රකාශන වැනි වර්ගීකරණයන්ගේ | සැපයුම්කරුවන්ගේ නම් ඇතුළත් ලැයිස්තුවක් වාර්ෂිකව සභාව විසින් පිළියෙල කිරීමට කටයුතු කළ | පළාත් සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවට අනුව, ඉහත මිලදී ගැනීම් සිදුකරමින් පවතී. මෙය 1987 ප්‍රාදේශීය සභා පනතට අනුව සභාව විසින් ප්‍රකාශයට |

| | |
|---|---|
| භාණ්ඩ හා සේවාවන් යුතුය. සැපයීමට හැකි සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවක් අඩංගු ලේඛනයක් සභාව විසින් පිළියෙල කර නොතිබුණි. | පත්කළ අංක 554/5 දරන (1989.04.17) දරන ගැසට් නිවේදනයේ VII වගන්තිය 3 උප වගන්තිය අනුව සිදු කර ඇත. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,371,183 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 5,583,474 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2018** | | | | **2017** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | කුලී | 779,000 | 823,045 | 449,118 | 305,442 | 599,000 | 710,975 | 362,966 | 348,009 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 141,000 | 434,634 | 434,634 | – | 324,000 | 142,845 | 142,845 | – |
| (iii) | වෙනත් ආදායම් | 8,712,500 | 14,717,862 | 5,311,389 | 9,474,958 | 7,377,000 | 9,975,365 | 7,388,007 | 2,587,358 |
| | එකතුව | 9,632,500 | 15,975,541 | 6,195,141 | 9,780,400 | 8,300,000 | 10,829,185 | 7,893,818 | 2,935,367 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් කඩ කුලී, බදු ගාස්තු, සේවා ගාස්තු සහ දඩ මුදල් ආදිය නියමිත පරිදි අයකර ගැනීමේ මන්දගාමී ස්වරූපයක් නිරීක්ෂණය විය. එසේම සමාලෝචිත වර්ෂයේ රැස් කර තිබූ ආදායම් එකතුව රු.මිලියන 2.42 ක් සමාලෝචිත වර්ෂයට අදාළ එවැනි ආදායම් | හිඟ ආදායම් නියමිත පරිදි තක්සේරු කර වාර්ෂිකව ඒවා අයකිරීමට කටයුතු කළ යුතුය. එසේම හිඟ හිටව පවතින ඒවායේ කාල විශ්ලේෂණය ද වාර්ෂිකව පිළියෙල කර ඉදිරිපත් කිරිමට කටයුතු | උසාවි දඩ මුදල් නොලැබීමත් ආදායම් නිලධාරියෙකු නොමැති වීමත් හේතුවෙන් හිඟ ආදායම් වැඩිවී තිබුණි. |

| | | |
|---|---|---|
| රු.මිලියන 9.2 කින් සියයට 26 ක් සහ පසුගිය වර්ෂවල අයකර ගත යුතුව තිබූ එකතුව රු.මිලියන 12.12 කින් සියයට 20 කුත් වී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂ අවසානයේ පැවති හිඟ ආදායම්වල කාල විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | කළ යුතු වේ. | |

**2.2.3 වරිපනම් හා බදු**

----------------------

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1989 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති පරිච්ඡේදයේ III පරිච්ඡේදයේ 32 වගන්තිය ප්‍රකාරව සභාව විසින් සමලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු තක්සේරු ලේඛන පවත්වා නොතිබුණි. | වරිපනම් බදු තක්සේරු ලේඛන නඩත්තු කිරීමට කටයුතු කළ යුතුය. | අප සභාවේ ආදායම් පරීක්ෂකවරුන් නොමැති වීම, නිලධාරීන්ගේ හිඟ ආදිය නිසා සමාලෝචිත වර්ෂයට අදාළ වරිපනම් බදු තක්සේරු ලේඛන පවත්වා ගෙන නොතිබුණි. මේ පිළිබඳ ක්‍රියාමාර්ග දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. |

**2.2.4 බලපත්‍ර ගාස්තු**

-----------------

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියමනයන් ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ ඉදිකර තිබූ විදුලි සංදේශ කුළුණු 03 ක් සම්බන්ධයෙන් සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම, මූලික සැලසුම් අනුමත කිරීම, අනුකූලතා සහතික නිකුත් කිරීම සහ ආවරණ අනුමැතිය ලබාදීම යන සතර ආකාරයේ ගාස්තු සම්පූර්ණයෙන්ම අයකර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර ගාස්තුවල එකතු වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙනැවිත් නොතිබුණි. | අදාළ අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාර සියළුම විදුලි සංදේශ කුළුණු සම්බන්ධයෙන් මෙවැනි වර්ග 04 ක ගාස්තුත් නියමිත පරිදි වාර්ෂිකව තක්සේරු කර සභාවේ ආදායම් ගිණුමට ගෙන ඒමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා 1987 අංක 15 දරන පනතේ 17.2 වගන්තිය අනුව බාධා වී ඇත. එසේ වුවත්, අදාළ ආයතනවලට නියමිත ගාස්තු ගෙවන ලෙස අප විසින් දන්වා තිබුණත් ඔවුන් විසින් ගෙවීම් කර නොතිබුණි. |

**2.2.5 උසාවි දඩ මුදල්**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.8,550,183 ක උසාවි දඩ මුදල් ලැබිය යුතුව තිබුණි. | සභාවට අයත් උසාවි දඩ මුදල් ඒවා හිමිකම් පෑමෙන් අනතුරුව වර්ෂයක් ඇතුළත ප්‍රධාන ලේකම්වරයාගේ ඉල්ලීම් කිරීමෙන් ලබාගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ සියළුම බලධාරීන්ගෙන් 2018.12.31 දිනට රු.8,550,183 ක් වන උසාවි දඩ මුදල් අදාළ අයගෙන් ඉල්ලීම් කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ සියළුම වර්ගයේ ක්‍රියාකාකරකම් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් විධිමත් ආකාරයෙන් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පසුගිය වර්ෂය අවසානයේදී පිළියෙල කර නියමිත අයුරින් අනුමත කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඇත. |

**(ආ) සන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශයේ බැහැර කරනු ලබන කැලිකසළ, ගිනිතැබීම හා වලදැමීම යන කාර්යයන් පමණක් සභාව විසින් සිදු කරන අතර කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘති වැනි සන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාත්මක | සන අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් සභාව විසින් ඵලදායී ක්‍රමෝපායන් අනුගමනය කර ක්‍රියාත්මක කළ යුතු වේ. | ඉදිරියේදී මෙවැනි ක්‍රියාමාර්ග ගැනීමට මූලික කටයුතු කෙරෙමින් පවතී. |

කිරීමට එලදායී ක්‍රියාමාර්ග ගැනීම තවදුරටත් මන්දගාමී මට්ටමේ පැවතුණි.

**(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2030 වර්ෂයේ තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සභාව විසින් ළඟා කර ගත යුතු ඉලක්ක සහ එම ඉලක්ක ළඟාකර ගැනීමේදි පවතින දුෂ්කරතාවයන් මෙන්ම ඉදිරි ක්‍රියාකාරකම් මැනීම සඳහා දර්ශකයන්ද 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ප්‍රකාරව සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2030 වර්ෂයේ තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය සුදුසු දර්ශකයන් ඇති කිරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව අයවැය ප්‍රකාරව ක්‍රියාත්මක කළ යුතු සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක නොකර එකතුව රු.මිලියන 23.2 ක අරමුදල් පසුගිය වර්ෂ 04 ක සිට බැංකුවක ස්ථාවර තැන්පතු ගිණුමක ආයෝජනය කර තිබූ බව නිරීක්ෂණය විය. | ස්ථාවර තැන්පතු උපයෝගී කරගෙන හෝ එහි ආදායමින් ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් සම්බන්ධයෙන් වාර්ෂිකව ක්‍රියාත්මක කළ යුතු කාර්යයන් නියමිත පරිදි සැලසුම් කර විධිමත් අනුමැතියකින් පසුව ක්‍රියාත්මක කිරීමට සභාව විසින් කටයුතු කළ යුතුය. | අප සභාව ආදායම් අඩු සභාවක් වීම නිසා මෙම තත්ත්වයෙන් අප සභාවේ ක්‍රියාකාරකම් අඛණ්ඩව කරගෙන යාම සඳහා අරමුදල් අවශ්‍ය බැවින්, බැංකුවෙන් ලැබෙන ස්ථාවර තැන්පතු පොලී ආදායම් රු.2,326,603 ක් වැනි විශාල ප්‍රමාණයක් 2018 වර්ෂයේ උපයාගෙන තිබුණි. |
| (ආ) | සභාවට පරිත්‍යාග ලෙස ලැබී තිබූ ලී බඩු හා කාර්යාල උපකරණ 134 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම්වල වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. කෙසේ වුවද, එවැනි උපකරණ ලැබූ දිනය, ඒවායේ | සභාවට පරිත්‍යාග ලෙස ලැබී භාවිතා කරනු ලබන සියළුම ලී බඩු හා කාර්යාල උපකරණවල වටිනාකම සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වේ. | කඩිනමින් වටිනාකම් තක්සේරු කර ඇතුළත් කරනු ලබන බව සහතික කරමි. |

| | | | |
|---|---|---|---|
| | භාවිතය, ආර්ථික ජීව කාලය ආදිය විගණනයට දැනගත නොහැකි වී තිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ එකතුව රු.මිලියන 101.2 කට ඇස්තමේන්තු කර තිබූ මූලධන වැඩසටහන් 07 ක් ක්‍රියාත්මක නොකර මුළුමනින්ම අතහැර දමා තිබුණි. කෙසේ නමුත්, මේ සඳහා හේතු විගණනයට ඉදිරිපත් වී නොතිබුණි. | වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ඇතුළත් කළ ක්‍රියාකාරකම් ඵලදායී ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදාළ වර්ෂයේ අපේක්ෂා කළ ආදායම් ලැබී නොතිබූ නිසා මෙම ව්‍යාපෘති ඉටුකර නොතිබුණි. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අදාළව අනුමත කළ සේවක සංඛ්‍යාව, තාක්ෂණික නිලධාරී, ආදායම් පරීක්ෂක තනතුරුවල සියයට 50 ක පුරප්පාඩු පවතින අතර පිළිවෙලින් සංවර්ධන කාර්යයන් සහ ආදායම් අයකර ගැනීම් නිවැරදිව ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය. | සභාවේ දෛනික කටයුතු සහ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමටත් අනුමත කළ සේවක මණ්ඩලය ලබා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස්/ ප්‍රධාන ලේකම්වරයා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

### 3.4 වත්කම් කළමනාකරණය

#### 3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් දේපල, පිරියත හා යන්ත්‍රෝපකරණ, ලී බඩු හා උපකරණ, පරිගණක හා උපාංග ආදිය 2017 ජුනි 27 දිනැති මුදල් හා ජනමාධ්‍ය කළමනාකරණ අමාත්‍යාංශයේ අංක 01/2017 චක්‍රලේඛය ප්‍රකාරව පිළිවෙලින් ස්ථාවර වත්කම්, ලේඛන සහ පරිගණක උපාංග ලේඛන යනාදියෙහි ලේඛනගත කිරීමට හා යාවත්කාලීන කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | චක්‍රලේඛයට අනුව ස්ථාවර වත්කම් ලේඛන සහ පරිගණක උපාංග ලේඛන විධිමත්ව නඩත්තු කර යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. | 2017 ජුනි 28 දිනැති මුදල් හා ජනමාධ්‍ය කළමනාකරණ අමාත්‍යාංශයේ අංක 01/2017 දරන චක්‍රලේඛය අනුව ලේඛන දැනට පවත්වාගෙන යනු ලබන අතර කාර්තුවට අදාළ වාර්තාවන් ද අඛණ්ඩව යවනු ලැබේ. |

### 3.4.2 වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සභාවේ වාර්තාවන්ට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 757 අනුව සිදු කළ යුතු පසු විපරම් ක්‍රියාමාර්ග මේ දක්වා මන්දගාමීව පැවතුණි. | පසු විපරම් ක්‍රියාමාර්ග අදාළ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරිමට ප්‍රථම සිදුකර අවසන් කිරීමට කටයුතු කළ යුතු වේ. | සමීක්ෂණයෙන් පසුව ඉදිරි ක්‍රියාමාර්ග දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. |

### 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ සභාවට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාලසටහන පිළියෙල කර නොතිබුණි. | සභාව විසින් කඩිනමින් ඊළඟ වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන කාලසටහන පිළියෙල කර අනුමත කරගෙන ඒ අනුව කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇත. |

### 3.5.2 භාණ්ඩ හා සේවාවන්

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.1.4, 6.2.1, 6.3.3 හා 7.11.1 මාර්ගෝපදේශ අනුව පිළිවෙලින් ලංසු මිල ගණන් කැඳවීමේ ලේඛන ඒවා ඉදිරිපත් කිරීම සඳහා කාල පරාසයන් සඳහන් කිරීම, ලංසු විවෘත කිරීම පිළිබඳව සැපයුම්කරුවන් දැනුවත් කිරීම සහ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා ලබාගැනීම වැනි ක්‍රියාවලින් අනුගමනය නොකර සමාලෝචිත වර්ෂයේ එකතුව රු.1,057,570 ක් වටිනා භාණ්ඩ හා සේවා 10 ක් ලබාගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.1.4, 6.2.1, 6.3.3 හා 7.11.1 මාර්ගෝපදේශ ප්‍රකාරව කාර්යයන් ක්‍රියාත්මක කළ යුතු වේ. | ක්‍රියාවලිය දැනට අනුගමනය කෙරේ. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය සැලැස්ම නිවැරදි ක්‍රියාපටිපාටියක් මාර්ගයෙන් සැලසුම් කර පිළියෙල නොකිරීම නිසා සැලසුම් කළ විෂයයන් 06 ක් සහ තථ්‍ය වියදම් අතර සියයට 5 සිට සියයට 18 ක් දක්වා පරාසයක වෙනස්කම් ද, ඇස්තමේන්තුගත ආදායම් මාර්ග මාර්ග 05 ක තථ්‍ය ආදායම් අතර විචලනයන් පිළිවෙලින් සියයට 13 සිට සියයට 349 ක් දක්වා පැවතුණි. | වාර්ෂික අයවැය සැලැස්මේ පවතින අයවැය විෂයයන් නිවැරදි ක්‍රියාපටිපාටියක් මාර්ගයෙන් සැලසුම් කර තක්සේරු කර ක්‍රියාත්මක කිරීමට සභාව ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අපගේ සභාව නොදියුණු ප්‍රදේශයක් බැවින් ආදායම් මූලාශ්‍ර ඉතාමත් අඩු වශයෙන් පවතී. මේ නිසා ආදායම් රැස්කිරීමේදීත් අවහිරතා ඇති වේ. ලැබෙන ආදායමින් අපගේ වියදම් සිදු කෙරේ. එම නිසා අයවැය මඟින් අපේක්ෂා කළ ඉලක්කය වෙත ළඟා විය නොහැකි තත්ත්වයක් පවතී. |

### 4.2 අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ කටයුතු පරීක්ෂා කර කාර්යක්ෂමව ක්‍රියාකාරකම් කරගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අභ්‍යන්තර විගණකවරයාව ලේකම්වරයා විසින් පත්කර තිබූ අතර සේවක පුරප්පාඩු අඛණ්ඩව පැවැතීම නිසා කාර්යයන් තනිවම කර ගෙන යා නොහැකි වී ඇත. |